# ශ්‍රී ලංකා දුම්රිය සේවය

# ලංසු ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවයට ආනයනයන් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත්කිරීමේ ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන අංක : SRS/F.7859**

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයට වසර දෙකක කාලයක් සඳහා ආනයනයන් පරීක්ෂා කිරීමට පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා තැව් බඩු පරීක්ෂණයෙහි යෙදෙන පිළිගත් ආයතනවලින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින් මුද්‍රානැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසුකරණය ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට 2023-08-07 දින සිට 2023-09-18 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත දැක්වෙන ලිපිනයේදී වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ - 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2438078 / 94 (11) 2436818
ෆැක්ස් අංක : 94 (11) 2432044
ඊමේල් : tender2@railway.gov.lk/srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. නැව්බඩු පරීක්ෂා කිරීමේ ක්ෂේත්‍රයේ නියැලී අඩුතරමින් වසර 05 ක පළපුරුද්ද සහිත පිළිගත් ආයතන ලංසු ඉදිරිපත් කිරීම සඳහා යෝග්‍ය වේ.

05. අභිලාෂී ලංසුකරුවන්ට ශ්‍රී ලංකාව, කොළඹ - 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක් යොමුකිරීමෙන් හෝ "ඕ" උප ග්‍රන්ථයේ පැහැදිලිව සඳහන් කර ඇති විදේශ ශ්‍රී ලංකා දූත කාර්යාලවලින් රු. 3,500.00 ක හෝ පහසුවෙන් හැරවිය හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමට ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2023-08-07 දින සිට 2023-09-18 දින ප.ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.

06. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් 750,000.00 ක හෝ පහසුවෙන් හැරවිය හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමැති ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. සමාන වටිනාකම නිර්ණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශිත, ලංසු ඉදිරිපත් කිරීම සඳහා වන අවසාන දිනයට දින 28 කට පෙර පවත්නා විකුණුම් විනිමය අනුපාතය යොද ගත හැකිය.

07. ලංසු 2023-09-19 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතු අතර ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද ලංසු භාර නොගැනේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ - 10.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංක SRS/F.7859**